පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

| | | |
|---|---|---|
| විෂය - චිත්‍ර විෂය | සතිය -<br>ශ්‍රේණිය - 6 | සැකසුම - උපුලී චතුරානි ධර්මසේන<br>මාවනැල්ල අධ්‍යාපන කලාපය |

## 6.13 හින්දු කෝවිලක මූලිකාංග හා එහි කලා නිර්මාණ

- පහත රූප සටහන් හොඳින් බලන්න.




යාපනයේ නල්ලූර් කෝවිල නල්ලූර් නගරයේ පිහිටා ඇත



හලාවත මුන්නේශ්වරම් කෝවිල


- හින්දු ආගමික බැතිමතුන්ට වන්දනාමාන කිරීම සඳහා නිර්මාණය කළ ගොඩනැඟිලි විශේෂයකි.
- ශ්‍රී ලංකාව තුළ පොළොන්නරු යුගයේදී හින්දු ආගම ව්‍යාප්ත වීමත් සමඟ හින්දු කෝවිල් නිර්මාණය වී ඇත.
- ඉතා අලංකාර ගෘහ නිර්මාණයක් වන මෙහි බිම් සැලැස්ම කොටස් හතරකින් සමන්විතය.
  1. ගෝපුර / ගෝපුරම්
  2. මණ්ඩපය
  3. ප්‍රදක්ශිණා පථය
  4. ගර්භගෘහය

හින්දු කෝවිලක බිම් සැලැස්ම




- මෙහි ප්‍රධානම ගෘහ නිර්මාණ අංගය වන්නේ ගෝපුරයයි. කෝවිලේ ප්‍රධාන දොරටුවට ඉහළින් ඇති මෙම ගෘහ නිර්මාණාංගයේ විමන අට්ටාල දැකිය හැකි අතර ඒවායේ දේව රූප තැන්පත් කර ඇත.
- ශිව දෙවියන්ගේ වාහනය වන නන්දි ගවයගේ රුව බොහෝ හින්දු දේවාල තුළ දැකිය හැකිය.(කළු ගලින් නිමවා ඇත. හින්දු ආගමික සංකේතය ලෙස භාවිත කරන්නේ වෘෂභ කොඩියයි.
- ගර්භගෘහය තුළ කුඩා හින්දු දේවාලයක හැඩය ගත් ආකෘතිමය කලා අංගයකි.
- ශ්‍රී ලංකාවේ හින්දු කෝවිල් නිර්මාණ කලාව කෙරෙහි දකුණු ඉන්දියනු කලා ආභාසය ලැබී ඇත.

හින්දු කෝවිල



ඇගයීම

1. පහත දැක්වෙන්නේ හින්දු කෝවිලක කුමන අංගයක්ද?





2. හින්දු කෝවිල් නිර්මාණය සඳහා බලපෑවේ කවර කලා අභාසයක් ද්?

3. හින්දු කෝවිලක බිම් සැලැස්මේ දක්නට ලැබෙන කොටස් මොනවා ?

4. ගර්භගෘහය තුළ දක්නට ලැබෙන දේවල් මොනවා ද?

5. ශ්‍රී ලංකාවෙ දක්නට ලැබෙන හින්දු කෝවිල් දෙකක් නම් කරන්න.